# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව

# ඇබෑර්තු

## නිර්වින්දන විශේෂඥ වෛද්‍ය (හෘද හා උරස්) තනතුර

### *ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ*

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ උසස් හෘද රෝග මධ්‍යස්ථානය, උසස් තිමාවේ, ඉහළ පරිමාවේ වැඩිහිටි හෘද රෝග ශල්‍යකර්ම වසරකට 500 කට වැඩි සංඛ්‍යාවක් සිදු කරනු ලබන ප්‍රමුඛ පෙළේ හෘද රෝග මධ්‍යස්ථානවලින් එකකි. එහි ඇඳන් 12 ක දැඩි සත්කාර ඒකකයක් (ICU) හා ඇඳන් 06 ක විශේෂ ප්‍රතිකාර ඒකකයක් (HDU) ද ඇත. සාර්ථක අයදුම්කරුට හෘද රෝග නිර්වින්දන වෛද්‍යවරයා ලෙස හුරුපුරුදු කාර්යයන්ට අමතරව හෘද උරස් (කාඩියෝතොරසික් - Cardiothoracic) කාර්ය භාර වෛද්‍යවරයා ලෙසද කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වේ. එම නිසා, ඉහත ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත.

| | | |
|---|---|---|
| **සුදුසුකම්** | : | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි මධ්‍යස්ථානයේ නිර්වින්දනය පිළිබඳ මාණ්ඩලික සහතිකය හෝ යෝග්‍යතාව සපුරා ඇති හෘද හා උරස් ශල්‍ය කිරීම නිර්වින්දනය සඳහා විශේෂ පුහුණුව ලබා හෝ පළපුරුද්ද ඇති අයට ප්‍රමුඛතාව දෙනු ඇත. |
| **වයස** | : | අයදුම්කරුවන් වයස අවුරුදු 50 ට අඩු විය යුතුය. අවුරුදු 50 අඩු අයදුම්කරුවන් නොමැති අවස්ථාවකදී වයස අවුරුදු 50 ට වැඩි විශේෂඥ වෛද්‍යවරුන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනේ. |
| **වැටුප් පරිමාණය** | : | රු. 118,800 - 12 X 3,645 - 162,540/- මාසිකව<br>මීට අමතරව රාජ්‍ය අංශයේ ගෙවනු ලබන අමතර දීමනා හා අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කළ අමතර දීමනාද ගෙවනු ලැබේ. |
| **රැකියා නියුක්තියේ නියමයන්** | : | අර්ථ සාධක අරමුදල් පදනම මත |

රාජ්‍ය සේවයේ තනතුරු හොබවන අයදුම්කරුවන් තම අයදුම්පත් ඔවුන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානින් මගින් අයදුම් කළ යුතුය.

පත්වීමක් ලබාදීම හෝ නොදීම පිළිබඳ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

සම්පූර්ණ ජීවදත්ත හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහිත තම අයදුම්පත් අයදුම්කරුවන් විසින් 2021.09.13 දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව,**
**තලපත්පිටිය, නුගේගොඩ.**
**2021 අගෝස්තු 25**